L.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

Article 12(1)

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019/09/25

පැමිණිලිකරු : ඊ.එච්.එස්. හේවා අධිකාරම් මයා,
සුනන්ද මාවත, ඉව්වගල,
මතුගම.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
මතුගම සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලය,
මතුගම.

02. එස්.පී. විමලවීර මිය,
අභියාචනා කමිටුවේ සභාපති,
කලාප අධ්‍යාපන කාර්යාලය,
බණ්ඩාරගම.

පැමිණිලි අංකය : **HRC/4392/16**

පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් 2016-10-07 වන දින සිය පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා 2017 වර්ෂයේ මතුගම සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලයේ 01 වන වසරට ඇතුළත් කිරීමේ අරමුණින් ආසන්නතා පදනම යටතේ අයදුම්පත්‍රයක් යොමු කළ බවත්, කැඳවීම් අංකය CO 94 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 90ක් උපයා ගත් බවත්ය. නමුත් තමාට බඳුගම ධර්මානන්ද කණිෂ්ඨ විද්‍යාලයට ලකුණු 05 ක් අඩු කර ඇති බවත්, එම අඩු කළ ලකුණු 05 තමා හට ලැබිය යුතු බවත්, ඒ අනුව තම මුළු ලකුණු ප්‍රමාණය 95 ක් වන බවත් සඳහන් කර ඇත. එසේම තමා ගල්දෙණිය කණිෂ්ඨ විද්‍යාලය ආසන්නයේ පදිංචිව සිටින බවත්,



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අයදුම්කරුවන් පිරිසකට එම ආසන්න පාසල වෙනුවෙන් ලකුණු 05ක් අඩුකල යුතු වුවත්, එසේ අඩු නොකිරීම හේතුවෙන් ළමුන් 25 දෙනෙකුට ලකුණු 05 එකතු වීම මත එයින් ළමයින් කිහිපදෙනෙකු පාසලට ඇතුලත් වී මේ වන විට අධ්‍යාපන කටයුතු හදාරමින් සිටින බවත්, ඉහත පාසල වෙනුවෙන් එම අයදුම්කරුවන්ට ලකුණු අඩු නොකිරීම හේතුවෙන් තම දරුවාට අසාධාරණයක් සිදු වී ඇති බව දන්වා ඇත. පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා කමිටුවද ස්ථානීය පරීක්ෂණයක් සිදු නොකල බවයි.

තවද 2004-10-04 දිනැතිව මතුගම ප්‍රාදේශිය සභාව නිකුත් කොට ඇති ගල්දෙනිය කන්ද කණිෂ්ඨ විද්‍යාලයට මාර්ග පහසුකම් සකස් කර ඇති බවට වන ලේඛණයක් ඉදිරිපත් කරමින් එම පාසලට ගමනාගමන අපහසුතාවයක් නොමැති බවට පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කර ඇත.

01 වන වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් දන්වා ඇත්තේ මෙම පැමිණිලිකරු ආසන්නතාවය මත සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 90ක් උපයාගෙන ඇති බවත්, පාසලට ළමුන් ඇතුලත් කිරීමේ අවම ලකුණු ප්‍රමාණය ලකුණු 95ක් වන බවත්ය. තවද ගල්දෙනිය කන්ද කණිෂ්ඨ විද්‍යාලයට එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ගමනාගමන පහසුකම් නොමැති බැවින් චක්‍රලේඛනය ප්‍රකාරව ලකුණු අඩු කිරීමේ ක්‍රමවේදයක් නොමැති බවත්, වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවට දන්වා ඇත.

02 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

අභියාචනා මණ්ඩල සභාපතිනිය විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, ගල්දෙනිය කන්ද කණිෂ්ඨ විද්‍යාලය (සඳසිරිගම) පාසලට ගමනාගමන පහසුකම් නොමැති හෙයින් එකී පාසල සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සභාපතිනිය එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ආසන්නතාව සලකා ලකුණු 05ක් අඩු කරන ලද බව සඳහන් කල බවයි. තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ස්ථානීය පරීක්ෂණයන් සඳහා ගෙන යාමට ලබා දුන් වැඩ් යන්ත්‍රය හරියාකාරව ක්‍රියාත්මක කිරීමට අපහසු වූ බවත්, පලමු නිවස හා පාසල අතර ඇති දුර ප්‍රමාණය නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේදී පැමිණිලිකරුගේ නිවසේ විනාඩි 45කට වැඩි කාලයක් රැදී සිටීමට සිදු වූ බැවින්ද, එම වැඩ් යන්ත්‍රය නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් ද යන සියලු කාරණා මත අභියාචනා මණ්ලයේ සභාපතිනිය වන තමා

මතුගම කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිනිය දැනුවත් කර එකී කාර්යය ඉටු කිරිමෙන් ඉවත් වූ බවද සඳහන් කර ඇත.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු –:

පැමිණිලිකරු ආසන්නතා පදනම යටතේ CO 94 අංකය යටතේ සම්මුඛ පරීක්‍ෂණයට සහභාගි වී ලකුණු 90ක් උපයාගෙන ඇති අතර, බද්දෙගම ධර්මානන්ද කණිෂ්ඨ විද්‍යාලයට ආසන්නතාවය මත ලකුණු 05 අඩු කිරිම නිසා මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 90ක් වී ඇත. එම ලකුණු 05 අඩු කිරිම පිළිබඳ කාරණය ප්‍රශ්නගත වනුයේ අභියාචනා මණ්ඩලය ඒ පිළිබඳ පරීක්‍ෂා කිරිමේදි ටැබ් යන්ත්‍රය නිසියාකාරව ක්‍රියාත්මක නොවිම මත පැමිණිලිකරුට හිමිවිය යුතු ලකුණු 05 ලබා දී නොමැති බව නිරීක්ෂණය වන හෙයිනි.

මෙම විද්‍යාලයට ආසන්නතා පදනම යටතේ පාසලට ළමුන් ඇතුළත් කර ගැනිමේ අවම ලකුණු සීමාව ලකුණු 95ක් බවත්, පැමිණිලිකරුට බද්දෙගම ධර්මකන්ද කණිෂ්ඨ විද්‍යාලයට ලකුණු 05 අඩු නොකළ යුතු අතර, එම ලකුණු 05 ඔහුට හිමිවිය යුතු බවත්, ඒ අනුව ඔහුගේ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 95ක් බවත්, ඒ අනුව පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුළත් වී අධ්‍යාපනය හැදෑරිමට අවස්ථාව හිමි විය යුතු බවත් නිරීක්ෂණය වී ඇත.

ඉදිරිපත් කර ඇති කරුණු අනුව ආසන්නතා පදනම මත ගල්දෙනිය කන්ද කණිෂ්ඨ විද්‍යාලට (සදසිරිගම) ගමනාගමන පහසුකම් නොමැති බව පවසා චක්‍ර ලේඛය ප්‍රකාරව ලකුණු 05ක් අඩු නොකිරිම නිසා ළමුන් 25 දෙනෙකුට ලකුණු 95ක් බැගින් ලකුණු ලැබිම මත ළමයින් කිහිපදෙනෙකු දැනට එම විද්‍යාලයේ ඉගෙනුම ලබන බව පරීක්ෂණයේදි කරුණු අනාවරණය වී ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්විම තුළ ඒ ඒ අයදුම්කරුවන්ට ලබා දී ඇති ලකුණු ප්‍රමාණයන් නිවැරදිද යන කරුණ තවදුරටත් විසඳිය යුතු කරුණක් ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත්ව ඇත. එනම් ආසන්න වෙනත් පාසල් සඳහා ලකුණු කපා හැරිමේදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සභාපතිනිය විසින් ගල්දෙනියකන්ද කණිෂ්ඨ විද්‍යාලයට ගමන් කිරිමේ ප්‍රවේශ මාර්ග දුෂ්කර විම යන පදනම යටතේ ඇතැම් අයදුම්කරුවන්ට අඩු කළයුතු ලකුණු 05ක ප්‍රමාණය අඩු කොට නැති බව නිරීක්ෂණය වී ඇත. ඇය විසින් මෙසේ ගමනාගමන පහසුකම් නොමැති බවට ප්‍රකාශයක් පමණක් සිදු කොට ඇති අතර, ඒ මත තමා චක්‍රලේඛනය ප්‍රකාරව ක්‍රියා කළ බව දන්වා ඇත. නමුත් ගමනාගමන

පහසුකම් දුෂ්කර බව සනාථ කොට ගැනිමට අදාළ කොටගත් පදනම හෝ සිද්ධාන්ත පිළිබඳව කිසිදු කරුණු දැක්වීමක් සිදු කොට නැති බවද සඳහන් කර ඇත.

මෙම කරුණට අදාළව කරුණු දක්වන පැමිණිලිකරු ලිඛිත සාක්ෂි මගින් ඊට හාත්පසින් වෙනත් කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇත. එනම්, ගල්දෙනිය කන්ද කණිෂ්ඨ විද්‍යාලයට ප්‍රවේශ මාර්ගයක් මතුගම ප්‍රාදේශිය සභාව විසින් සකස් කොට දී ඇති බවත්, ඒ මත එම පාසලට ආසන්න දරුවන්ට කිසිදු දුෂ්කරතාවයකින් තොරව එම පාසලට ගමන් කිරීමේ හැකියාවක් පවතන බවත්, එම නිසා ඉහත පාසල ප්‍රවේශ මාර්ගය නොමැති පාසලක් නොවන බවත්ය. ප්‍රාදේශිය සභා අනුමැතිය මත ඉදි කර ඇති ප්‍රවේශ මාර්ගයට අදාළ සිතියම් හා පිඹුරු පතක් සාක්ෂි ලේඛනය මගින් ඉදිරිපත් කරමින් කරුණු දැක්වීමක් සිදු කොට ඇත.

චක්‍රලේඛනයේ පවතින සුවිශේෂ නීති තත්ත්වයන් තම අභිමතානුශාරි තීරණ මත යොදා ගනිමින් යම් දෘශ්‍යමාන අයදුම්කරුවන් පිරිසකට වාසි සහගත ලෙස තීරණ ගැනීමට විදුහල්පතිනිය ක්‍රියා කොට ඇති බවක් හා විදුහල්පතිතුමියගේ ඉහත අභිමතානුශාරි තීරණය හමුවේ ඇය අපේක්ෂා නොකළ පැමිණිලිකරු ඇතුළු වෙනත් පිරිසකට කිසියම් අගතියක් සිදු වී ඇති බවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ කරුණු අනාවරණය වී ඇත.

විශේෂයෙන්ම කිසියම් රාජ්‍ය නිලධාරියකු විසින් තම රාජකාරි වඩාත් විනිවිදභාවයකින් කළයුතු අතර, එකී තීරණය හෝ ක්‍රියාවන් සාක්ෂි මගින් තහවුරු කළ හැකි නම් පමණක් ක්‍රියාවට යෙදවීමට වගබලා ගත යුතුය.

මෙම කරුණු අනුව 2017 වසරේ මතුගම සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛනයට පරිභාහිරව අත්තනෝමතික ආකාරයෙන් වගඋත්තරකාර විදුහල්පතිනිය කටයුතු සිදු කර ඇති බව නිරීක්ෂණය වන අතර, එම වැරදිසහගත ක්‍රියාවලිය හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවද අනාවරණය වී ඇත.

තවද ගල්දෙනිය කන්ද කණිෂ්ඨ විද්‍යාලයේ මාර්ග පහසුකම් නොමැති බව වගඋත්තරකාර පාර්ශවය පැවසුවද, මතුගම ප්‍රාදේශිය සභාව විසින් එම පාසලට යන මාර්ගය සංවර්ධනය කරන ලද බවට වන වාර්තාවක් පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවට ද අදාළ වගඋත්තරකාර පාර්ශවයටද සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කර ඇති නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය එම පාසලට ලකුණු අඩු නොකිරීම හේතුවෙන් මේ වන විටත් සුදුසුකම් නොමැති දරුවන් කිහිපදෙනෙකු එම විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු හදාරමින් සිටින බවට කරුණු අනාවරණය වී ඇත.

තවද ආසන්නතා ගණය යටතේ චක්‍රලේඛනය තුළ ඉතා නිවැරදිව ක්‍රියාකළ යුතු ආකාරය අර්ථකතනය කොට ඇති අතර, ආසන්නතාවය යටතේ දරුවන් ඇතුලත් කර ගත යුත්තේ කුමන ආකාරයෙන්ද යන්න නිවැරදිව දක්වා ඇත. චක්‍රලේඛනයේ ඇතුලත් නිර්නායකයන් යටතේ ඉතා නිවැරදිව ආසන්නතා පදිංචිකරුවන් කවුරුන්ද යන්න හඳුනාගැනීමට නිත්‍යානුකූලව හැකියාව තිබියදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනා මණ්ඩලයේ සභාපතිනිය පවා නොමග යවා ඇති බවට කරුණු නිරීක්ෂණය වී ඇත. ඒ අනුව ගල්දෙනිය කන්ද කණිෂ්ඨ විද්‍යාලයට (සඳසිරිගම) ලකුණු 05ක් අඩු කළයුතු බවට වාචිකව පවසා එම විද්‍යාලයට මාර්ග පහසුකම් තිබියදීත් ලකුණු 05ක් අඩු නොකිරීම සිදු වී ඇති බවට කරුණු අනාවරණය වී ඇත. තවද ආසන්නතා පදිංචිකරුවන්ට සාධාරණයක් ඉටු කළයුතු බවට මනංකල්පිත නිර්නායකයන් නිර්මාණය කර ගනිමින් නිත්‍යානුකූල නොවන තෝරා ගැනීම් සිදු කර ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇත.

ඉහත කී සමස්ථ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැවති විමර්ශනයේදී වගඋත්තර පාර්ශවය වෙතින් සිදු වූ යාන්ත්‍රික දෝෂයක් මත නිසි නිගමනයකට නොපැමිණීම හේතුවෙන් මෙම සිසුවාට අවාසිදායක තත්වයක් මතුව ඇති බවත්, ලකුණු 05 ක් හිමි නොවන සිසුනට ලකුණු ලබා දීම තුලින් මෙම සිසුවාට හිමි ස්ථානය අහිමි වී ඇති බවත් නිරික්ෂණය වේ.

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් ක්‍රියා කොට ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන ඊ.එච්.එන්.ටී. හේවා අධිකාරම් දියණිය වගඋත්තරකාර විද්‍යාලයේ 2019 වර්ෂයේ 3 වන ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019. 10 .30 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය,
   බත්තරමුල්ල.

2. ගරු අමාත්‍යතුමා,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/